සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

විෂයය	වාරය	ශ්‍රේණිය	පාඩම
පුරවැසි අධ්‍යාපනය	03	10	05. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය



සැකසුම - *පී.ඒ.නන්දන ජයකුමාර*

බප/හො/ මීවනපලාන මහා විද්‍යාලය

ගැටුම සම්බන්ධයෙන් පවතින නිර්වචන

- “ ගැටුමක් යනු සමනය කළ නොහැකි අරමුණු තමන් අතර ඇති, නැතහොත් එසේ ඇතැයි සිතන පාර්ශව දෙකක් හෝ වැඩි ගණනක් අතර ඇති සම්බන්ධතාවයකි ”

- මහාචාර්ය ක්‍රිස්ටෝපල් මීවෙල්-

- “ ගැටුමක් යනු සමාජ කණ්ඩායම් එකිනෙකාට එරෙහිව යොදාගන්නා විරෝධය හෙවත් එරෙහි වීමයි ”

-ක්වින්ස් රයිට්-

- මේ අනුව මිනිසුන් තුළ පවත්නා විවිධත්වය ගැටුම තුළින් පිළිඹිබු වන අතර පුද්ගල අරමුණු, අභිලාෂයන්, අවශ්‍යතාවයන්ගේ විවිධත්වය මත ගැටුම නිර්මාණය වේ.

- එම විවිධත්වය පුද්ගලයා තුළ, පුද්ගලයින් අතර, පුද්ගලයින් හා රාජ්‍ය අතර, රාජ්‍ය හා රාජ්‍ය අතර ගැටුම් නිර්මාණය වේ.

- ගැටුමක විනාශකාරී ලක්ෂණ මෙන්ම සාධනීය ලක්ෂණද දක්නට ලැබේ.

- සමාජ සංවර්ධන ක්‍රියාවලිය තුළ සාධනීය හා නිර්මාණාත්මක වැඩකොටසක් ඉටුකරන බලවේගයක් ලෙසද ගැටුම පෙන්වාදිය හැක.

උදා- නොවිසඳී ඇති ප්‍රශ්නයක් හෝ ප්‍රශ්න මාලාවක් වෙනත් ආකාරයකට ප්‍රකාශයට පත් කිරීමක් මෙ මගින් සිදුවේ.

පුද්ගල මනසෙහි සාමය ඇති කරගැනීම සඳහා යොමු විය හැකි අංශ

- ❖ ආගමික වතාවත් කෙරෙහි යොමුවීම
- ❖ මනෝවිද්‍යාත්මක අභ්‍යාස මගින්
- ❖ උපදේශනය මගින්
- ❖ ස්වාභාවික පරිසරය නිරීක්ෂණය මගින්

ජොහාන් ගැල්ටුන්ගේ ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය



A- චර්යාව

- ගැටුම හා සම්බන්ධ චර්යාව විවිධාකාරවේ. එය සහයෝගී හෝ බලහත්කාරී විය හැකි ය. මෙම බලහත්කාරී චර්යාව ප්‍රචණ්ඩකාරී හෝ විනාශකාරී විය හැක.

B- සන්දර්භය

- ගැටුමට පසුබිම් වන තත්වයයි. ඒ යටතේ පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් මත හටගත් සම්බන්ධතා මත ගැටුම් ඇතිවේ. මේ මගින් ගැටුමට මුල්වන සමාජ, ආර්ථික, දේශපාලන වාතාවරණය පැහැදිලිවේ.

C- ආකල්ප

- ගැටුම නිර්මාණය වීමට බලපාන මනෝවිද්‍යාත්මක සාධක වේ. නොඑසේනම් පාර්ශවකරුවන් ඇති කර ගන්නා අසත්‍ය හෝ වැරදි අවබෝධයයි. ප්‍රචන්ඩකාරී ගැටුම් ඇතිවන්නේ පාර්ශ්වකරුවන් ඇතිකර ගන්නා වැරදි අවබෝධයෙනි. ඒ තුළ බිය, සැකය, අපේක්ෂාභංගත්වය, වෛරය වැනි මානසික තත්වයන් නිර්මාණයවේ. එහි ප්‍රතිඵලයක් ලෙස සතුරු ආකල්ප ඇතිවී ගැටුම් නිර්මාණය වේ.

ගැටුම් ඇතිවන පාර්ශ්ව

- පුද්ගලයා තුළ

  පුද්ගල අභ්‍යන්තර හා බාහිර හේතු නිසා පුද්ගලයා තුළ නිර්මාණය වන ගැටුම්

❖ පුද්ගලයින් අතර

❖ පවුල තුළ

අඹු සැමියන් අතර, මව්පිය දූ දරුවන් අතර ඇතිවන ගැටුම්

❖ ජන කණ්ඩායම් අතර

වාර්ගික, ආගමික, කුල, ගෝත්‍ර අතර විවිධ පරස්පරතා, මත භේද නිසා ඇතිවන ගැටුම්

❖ රාජ්‍යන් තුළ

රාජ්‍ය ප්‍රතිපත්ති,දේශපාලන මතවාද,මත නිර්මාණය වන කැරලි, ත්‍රස්ත ක්‍රියා ආදී ගැටුම්

❖ රටවල් අතර

දේශ සීමා, සම්පත් බෙදා ගැනීම, දේශපාලන හේතු මත, බලකාමය හේතූන් මත ගැටුම් ඇතිවේ.

ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන හේතු

- විවිධ ප්‍රතිරූප
- වෙනත් අදහස්
- සීමා ඇතිවීම
- අවහිරතා ඇතිවීම
- මානසික තත්ව
- පරමාර්ථ ඉටු නොවීම

ගැටුම් වර්ග (Types of conflicts)



01. අභ්‍යන්තර ගැටුම් (Internal conflicts)

- යම් රටක ජීවත්වන ජනතාව තුළ දැකිය හැකි පුද්ගල ගැටුම් හා සාමාජයීය ගැටුම් අභ්‍යන්තර ගැටුම් ලෙස හඳුන්වනු ලැබේ.

අභ්‍යන්තර ගැටුම්

- **සාර්ව ගැටුම්** → ජාතික මට්ටමින් නැතිනම් පුළුල් මට්ටමින් පවතින ගැටුම්කාරී තත්ව
  උදා- ජනවර්ග අතර/ආගම් අතර/ජාතික වෘත්තීය සමිති
- **සූක්ෂම ගැටුම්** → පුද්ගලයා තුළ,පුද්ගලයන් අතර, පවුල තුළ,පවුල් අතර ඇතිවන ගැටුම්
  උදා- මානසික ගැටුම්, ආර්ථික ප්‍රශ්න, ගෘහස්ථ ප්‍රචණ්ඩතාවය

සාර්ව ගැටුම්

සූක්ෂම ගැටුම්

02. අන්තර්ජාතික ගැටුම්

- රටවල් අතර පවත්නා ගැටුම් අන්තර්ජාතික ගැටුම් ලෙස හඳුන්වයි. මෙම ගැටුම් ප්‍රධාන කොටස් දෙකක් යටතේ දැක්විය හැක.

i. මතවාදී ගැටුම්

දේශපාලනික හා සමාජ ආර්ථික වශයෙන් පවතින මතවාදී ස්වභාවයන් මුල්කරගෙන ඇතිවන ගැටුම් මතවාදී ගැටුම් ලෙස හඳුන්වයි.

- ධනවාදී හා සමාජවාදී බල කඳවුරුවල පැවති ගැටුම්
- බටහිර හා පෙරදිග සංස්කෘතීන් අතර පවතින මතභේද
- බටහිර ක්‍රිස්තියානි හා මැදපෙරදිග ඉස්ලාමීය රටවල් අතර පවතින මතභේද

íí. යුධමය ගැටුම්

- පළවන හා දෙවන ලෝක සංග්‍රාම
- ඊශ්‍රායලය හා පලස්තීන යුද්ධය
- ඉන්දු පකිස්ථාන් යුද්ධය
- ඇමරිකාව ප්‍රමුඛ යුරෝපා ප්‍රජාව මැදිහත්ව කරන යුද්ධ

ගැටුම් ඇතිවන මූල

01. වාර්ගිකත්වය

- කුලය (රුවන්ඩාවේ ටුට්සිවරු හා හුටුවරු අතර ඇති වූ ගැටුම)
- ගෝත්‍ර අතර
- මතවාද
- කායික ස්වභාවය (දකුණු අප්‍රිකාවේ වර්ණ බේද වාදය)
- සමාජ ස්තර

02. දේශපාලන

- දේශ සීමා (ඉන්දු - පකිස්ථාන ගැටුම, ඊශ්‍රායල-පලස්තීන ගැටුම)
- බල ව්‍යාප්තිය (බටහිර ධනවාදී හා සෝවියට් දේශය සමග ගැටුම)

03. සමාජ ආර්ථික තත්වය

- දරිද්‍රතාව (සෝමාලියා හා ඉතියෝපියා)
- වෙළඳපොළ (ආර්ථික සම්බාධක පැනවීම)
- සම්පත් (මැද පෙරදිග අර්බුද)

04. ආගමික මතවාද

- ❑ නිකාය භේදය (අයර්ලන්ත යුද්ධය)
- ❑ ආගම් අතර (කුරුස යුද්ධය)

ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම

- සාකච්ඡා කිරීම
- සහමන්ත්‍රණය හා කේවල් කිරීම
- මැදිහත්කරණය
- සමථකරණය
- බේරුම්කිරීම
- විනිසීම

01- සාකච්ඡා කිරීම (Discussion)

- ❖ ගැටුම් නිරාකරණය සඳහා යොදා ගනු ලබන මූලිකම ක්‍රමය මෙය වේ. ගැටුමකට මුල්වූ පාර්ශ්ව දෙක සෘජුව හෝ වෙනත් මැදිහත්වීමකින් ගැටුම විසඳා ගැනීම මෙමගින් සිදුවේ.
- ❖ දෙපාර්ශ්වයට "ජය - ජය" විසඳුම් මෙමගින් ලබා ගත හැක.

සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණ

1. සාකච්ඡාවෙන් විසඳුම් කරා යොමුවීම
2. පෞද්ගලික හෝ විශ්වසනීය මට්ටමින් සිදුවීම
3. ක්ෂණික විසඳුම් ලැබීම
4. වියදම් අවම ක්‍රමයක් වීම
5. අවිධිමත් ව්‍යුහයකින් යුක්ත වීම
6. දෙපාර්ශවයට “ ජය - ජය ”විසඳුම් ලැබීම

සාකච්ඡා ක්‍රමය යොදා ගත හැකි අවස්ථා

- පෞද්ගලික ගැටුම්
- පවුලේ ගැටුම්
- දේපල ආරවුල්
- ආයතනික ගැටුම්
- ආයතන අතර ගැටුම්
- රට තුළ හා රටවල් අතර ගැටුම්

02- සහමන්ත්‍රණය හා කේවල් කිරීම
(Bargaining and amicable settlement)

- වෘත්තීය ක්ෂේත්‍රය තුළ සේවා- සේවක දෙපාර්ශවීය වෘත්තීය ගැටලු ඇතිවූ අවස්ථාවල එය විසඳා ගැනීමට මෙම ක්‍රමය යොදා ගනී.
- මෙහිදී ගැටුමට සම්බන්ධ පාර්ශව ඔවුනොවුන්ගේ ඉල්ලීම් සම්බන්ධව සාකච්ඡා කර විසඳුමකට ලඟා වේ.
- මෙහිදි ආරවුල් ඇතිවන අවස්ථාවලදී මෙන්ම එකඟ නොවන අවස්ථාවලදී දෙපාර්ශ්වය ඉවත්වී විරෝධය පෑම විශේෂ ලක්ෂණයකි.
- අවසානයේදී දෙපාර්ශ්වය තම තමන්ගේ ඉල්ලීම් සලකා බලා යම් යම් තීරණවලට එකඟ වී ගැටුම් විසඳා ගනී.
- කාර්මික ආරවුල්, වතු කම්කරු ආරවුල්, වෘත්තීය සමිති ආරවුල් වලදී මෙම ක්‍රමය යොදාගනු ලැබේ.

කේවල් ක්‍රමයේ ලක්ෂණ

1. කණ්ඩායම් ක්‍රියාවලියකි.
2. සේවක- සේව්‍ය දෙපාර්ශවයකින් යුක්ත වීම.
3. සාකච්ඡා මේසයේදී මුණ ගැසී සාකච්ඡා කිරීම.
4. අන්‍යෝන්‍ය එකඟතාව මත සිදුවීම.
5. විධිමත් ක්‍රියාවලියකින් යුක්ත වීම
6. සේවා කොන්දේසි, වේතන හා සම්බන්ධ ක්‍රියාත්මක වීම.
7. ඉල්ලීම් වලින් කේවල් කිරීම ආරම්භ වීම.
8. එකඟත්ව ගිවිසුමකින් කේවල් කිරීම අවසන් වීම.

03.මැදිහත්කරණය - (*Mediation*)

- පුද්ගලයින් දෙදෙනකු අතර හෝ කණ්ඩායම් දෙකක් අතර හෝ ජන කණ්ඩායම් අතර හෝ රටවල් දෙකක් අතර ගැටුම් විසඳා ගැනීමට සාකච්ඡා ක්‍රමය මගින් අපොහොසත් වන විට එය විසඳා ගැනීමට මෙම ක්‍රමය යොදා ගනු ලැබේ.
- මෙය යුධමය නොවන සාමකාමී මැදිහත්වීමකි.
- මේ සඳහා වෘත්තීය මැදිහත්කරුවන්, ගැටුම් නිරාකරණ විශේෂඥයින්, ගැටුමේ නිරත වූ පිළිගත හැකි සාමාජිකයින් හා බාහිර පාර්ශ්ව යොදාගත හැක.

මැදිහත්කරුවකු තෝරා ගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණු

1. දෙපාර්ශවයම පිළිගන්නා අපක්ෂපාතී පුද්ගලයෙකු වීම.
2. ගැටුම පිළිබඳව පූර්ණ අවබෝධයක් ඇති අයෙකු වීම.
3. තමාගේ විසඳුම්, තීන්දු ඔවුන් මත පටවන්නෙකු නොවීම.
4. දෙපාර්ශ්වයටම බලපෑම් එල්ල නොකිරීම.
5. දෙපාර්ශ්වයේ එකඟතාවය මත විසඳුම් කරා යොමු කරවීම.
6. සaජුව මුණ ගැසීමට නොහැකි අවස්ථාවල වෙන වෙනම හමුවී අදහස් ලබාගෙන දෙපාර්ශ්වයටම සන්නිවේදනය කිරීම.
7. නම්‍යශීලි විසඳුම් කරා යොමු කර “ජය- ජය” විසඳුම් ලබාදීම.

මැදිහත්කරුවෙකු තුළ පැවතිය යුතු ගුණාංග

1. හොඳ සවන් දෙන්නෙකු වීම.
2. විශ්වාසවන්තභාවය.
3. කැපවීම.
4. අවංක වීම.
5. අපක්ෂපාතීත්වය.
6. මධ්‍යස්ථභාවය
7. විචාරශීලී හා නිර්මාණශීලීභාවය

මැදිහත්කරණය යොදා ගත හැකි අවස්ථා

1. පවුල් ආරවුල් (ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය)
2. පාරිභෝගික හා වෙළෙඳ ආරවුල් (ප්‍රමිතියෙන් තොර භාණ්ඩ සම්බන්ධයෙන්)
3. කුලී නිවැසියන් හා අයිතිකරුවන් අතර ආරවුල් (කුලී නිවැසියන් ඉවත් කිරීම)
4. සේව්‍ය -සේවක ආරවුල්(වැටුප් හා අතිකාල දීමනා සම්බන්ධ ආරවුල්)
5. වැඩිහිටි මණ්ඩල (දරුවන් හා වයස්ගත දෙමාපියන් අතර ගැටුම්)
6. ජාතීන් අතර පවතින ගැටුම්
7. රටවල් අතර පවතින ගැටුම් විසඳීම සඳහා

04. සමථකරණය (Conciliation)

- සමථකරණය යනු ගැටුමක් හෝ මතභේදයක් විසඳීම සඳහා යොමු කරවන මැදිහත් වීමකි.
- මෙය අවසන් විසඳුම නොවේ.
- සමථකරු පුද්ගලයකු හෝ කණ්ඩායමක් විය හැක.
- ගැටුම් නිරාකරණය සඳහා ප්‍රතිවිරුද්ධ පාර්ශව සමග සාකච්ඡා මගින් විසඳුම් කරා යොමුකර ගැනීමට මෙමගින් හැකිවේ.
- ගැටුම් නිරාකරණය සඳහා සමථකරු යොමුවන්නේ එක පාර්ශ්වයක ඉල්ලීම මත හෝ වෙනත් අයෙකුගේ ඉල්ලීම මත හෝ පාර්ශ්වයක ඉල්ලීම මත විය හැක.
- ශ්‍රී ලංකාවේ සමථකරණය සඳහා නීත්‍යානුකූල ආයතනයක් ලෙස අධිකරණ අමාත්‍යාංශය මගින් සමථ මණ්ඩලය පිහිටුවා ඇත.

සමථකරුගේ කාර්යය

- ප්‍රතිවිරුද්ධ පක්ෂයන් අතර සංවාදයක් ඇති කිරීම.
- ගැටුමට තුඩු දී ඇති හේතු පිළිබඳව විග්‍රහ කිරීමට මුල පිරීම.
- ගැටුමට තුඩුදී ඇති හේතු පිළිබඳව සaජුව හෝ වක්‍රව සාකච්ඡා ඇති කිරීම.
- ප්‍රතිවිරුද්ධ පාර්ශවයන් අතර වෙනස්කම් හා පරස්පරතා අඩුකිරීමට ක්‍රියා කිරීම.
- සම්මුතීන්ට එළඹීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් යෝජනා කිරීම.

සමථකරණය යොදා ගතහැකි අවස්ථා

- ❖ පවුල් ආරවුල් විසඳීම සඳහා
- ❖ කම්කරු ආරවුල් විසඳීම සඳහා
- ❖ පුද්ගල කණ්ඩායම් අතර පවතින ආරවුල් විසඳීම සඳහා
- ❖ පොදු දේපල සම්බන්ධව පවතින ආරවුල් විසඳීම සඳහා
- ❖ සුළු වැරදි විසඳීම සඳහා

  (නින්දා අපහාස කිරීම, අවවාද දීම්, දේපළවලට හානි කිරීම.

05.බේරුම් කිරීම (Arbitration)

- බේරුම් කිරීම යනු යම් ගැටුමකට මැදිවී සිටින පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත මත ගැටුම විසඳා ගැනීම සඳහා යොදා ගනු ලබන මැදිහත්කරණ ක්‍රමයකි.
- ඒ සඳහා තෝරා ගනු ලබන පුද්ගලයා බේරුම්කරු ලෙස හඳුන්වයි.
- මෙහිදී ගැටුමට ලක්වී ඇති පාර්ශව දෙකෙහිම ප්‍රශ්න හා ගැටළුවලට සවන් දී අනතුරුව නිවැරදි පාර්ශවය හඳුනා ගනී.
- මෙහිදී එක් පාර්ශවයක් පමණක් ජයග්‍රහණය කිරීම විශේෂ ලක්ෂණයකි.
- බේරුම් කිරීම යොදා ගතහැකි අවස්ථා;

  කාර්මික ආරවුල් විසඳීම

  සේවක වැටුප් හා අයිතිවාසිකම් පිළිබඳ ගැටුම්

  සේවක ගැටුම්

  විනය පරීක්ෂණ

  මුදල් පිළිබඳ ආරවුල්

බේරුම්කරුවකු සතු විය යුතු ගුණාංග

- හොඳින් සවන් දීම
- පක්ෂග්‍රාහී නොවීම
- මධ්‍යස්ථ වීම
- නිවැරදි තීරණ ගැනීම
- විචාරශීලී හා නිර්මාණශීලී වීම
- යමක් අර්ථවත්ව පැහැදිලි කිරීමේ හැකියාව
- සාධාරණභාවය

06. විනිසීම (Inquiry)

- ගැටුම් නිරාකරණය සඳහා යොදා ගනු ලබන සාම්ප්‍රදායික ක්‍රමය විනිසීම වේ.
- මෙම ක්‍රමය මගින් නඩු විභාගයට යාම මගින් ගැටුම නිරාකරණය කෙරේ.
- අධිකරණය දෙනු ලබන තීන්දුව අවසාන තීන්දුව වන අතර පරාජය වන පාර්ශ්වයට ඉහළ අධිකරණයකට අභියාචනා කිරීමට හැකියාව ඇත.

විනිසීම ක්‍රියාවලියේ ලක්ෂණ

1. සාකච්ඡාවෙන් දෙපාර්ශ්වයටම ඉවත් විය නොහැක.
2. විත්තිකරු අධිකරණයේ පෙනී සිටිය යුතුය.
3. සාක්ෂි දීම, නඩු ඇසීම විධිමත්ව සිදුවේ.
4. පාර්ශ්ව දෙකටම සාක්ෂිදීම , වාද කිරීම, හරස් ප්‍රශ්න ඇසීම සඳහා අයිතියක් ඇත.
5. නීතියේ ප්‍රතිපාදන අනුව තීරණය දීම.
6. උසාවි තීන්දුව අවසානාත්මක වන අතර සෑම පාර්ශවයක්ම තීන්දුවට බැඳී සිටී.
7. අභියාචනා කිරීමේ හැකියාව ඇත.
8. නඩුවේ පැරදුන පාර්ශ්වය නඩු ගාස්තු ගෙවිය යුතුය.

07. එකඟත්වය ගොඩ නැගීම (Building a compromise)

- ❖ තෙවන පාර්ශවයක් මගින් ගැටුමට අදාල පාර්ශව දෙක එකඟතාවයට පත් කිරීම මෙමගින් සිදුවේ.
- ❖ දෙපාර්ශ්වයට එකඟතාවය සහතික කරන ගිවිසුමක් සඳහා අත්සන් කොට ගැටුම් ඇතිවන අවස්ථා පාලනය කිරීම සිදුවේ.
- ❖ මෙම එකඟතාවයන් ක්‍රියාත්මක කිරීම සිදුවන ආකාරය සොයා බැලීම සඳහා තෙවන පාර්ශවයක් දායක වීම සිදුවේ .

එකඟත්වයෙන් ගැටුම් විසඳා ගත හැකි අවස්ථා

- පවුල් ආරවුල්
- සේව්‍ය- සේවක ආරවුල්
- අසල්වාසීන් සමඟ ආරවුල්
- ආයතන-ආයතන අතර ඇතිවන ආරවුල්
- සමවිය කණ්ඩායම් අතර ඇතිවන ආරවුල්

08. උපදේශනය (Counselling)

- පුද්ගල ගැටුම් මෙන්ම දෙපාර්ශවයක් අතර ඇතිවන ගැටුම් වලදී තෙවන පාර්ශවයක් විසින් විවිධාකාරයෙන් පහසුකම් සපයා උපදෙස් හා මග පෙන්වීම් ලබා දෙමින් ගැටුම් නිරාකරණයට යොමු වීම උපදේශනයයි

- මෙහිදී විකල්ප විසඳුම් කරා පාර්ශවකරුවන් යොමු කිරීම, ගැටුමින් ඇතිවන ප්‍රතිපල හා පීඩාකාරී ස්වභාවයන් පිළිබඳව දෙපාර්ශවයම දැනුවත් කිරීම, ගැටුම් ලිහිල් කිරීම සඳහා පාර්ශවකරුවන් යොමුකරවීමද උපදේශනය මගින් සිදුවේ

උපදේශකයකුගේ ගුණාංග

- විශ්ලේෂණ හැකියාව
- විනිශ්චය හැකියාව
- ඉවසීම
- ප්‍රබෝධය
- සංයමය
- පළපුරුද්ද
- ආත්ම විශ්වාසය
- නිර්මාණශීලීබව
- ඒකාග්‍රතාවය
- පරීක්ෂාකාරී බව

ගැටුම් නිරාකරණය සඳහා පුද්ගලයකු සතු විය යුතු පුද්ගල ගුණාංග

- ආත්මාවබෝධය
- ඉවසීම
- කරුණාව හා මෛත්‍රිය
- නිර්මාණාත්මක චින්තනය
- මුදිතාව
- අවිහිංසක බව
- සංවේදී බව
- දරා ගැනීමේ ශක්තිය
- ඵලදායී තීරණ ගැනීම
- ඵලදායී සන්නිවේදනය

ගැටුම් නිරාකරණය සඳහා පුද්ගලයකු සතු විය යුතු සාමාජීය ගුණාංග

- අන් මත ගරු කිරීම
- යුතුකම් ඉටු කිරීම
- සාධාරණත්වය
- ජය පරාජය විඳ දරා ගැනීම
- අන් අයට ගරු කිරීම
- පරිත්‍යාගශීලී බව
- යහපත් අන්තර් පුද්ගල සබඳතා
- සවන් දීම

ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීමේ වාසි

- ජීවිත හානි වැලකීම.
- සම්පත්, දේපල හානි වැළකීම.
- මූලික හා මානව අයිතීන් ආරක්ෂාවීම.
- මානසික ආතතිය අවම වීම.
- පුද්ගල මානසිකත්වය ඉහළ යාම.
- ආත්ම ගෞරවය සුරැකීම .
- සාමය හා ආරක්ෂාව සුරක්ෂිත වීම.
- දේශපාලන ස්ථාවරත්වය.
- ආර්ථික ස්ථාවරත්වය.
- ජාතික ඒකාබද්ධතාව ඇතිවීම.
- රට සමaද්ධිමත් වීම.

සවියෙන් පෙරට අපි එකට

***e*- ඉගෙනුම් පාසල**

හොරණ අධ්‍යාපන කලාපය

විෂයය	ශ්‍රේණිය	වාරය	පාඩම
පුරවැසි අධ්‍යාපනය	**10**	**03**	**05. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය -ඇගයීම-**

සැකසුම - පී.ඒ. නන්දන ජයකුමාර, බප/හො/මීවනපලාන මහා විද්‍යාලය

❖ **1 – 5 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න**

01. ගැටුම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී යොදා ගනු ලබන ත්‍රිකෝණ අරගල ගැටුම් අකෘතිය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින්ද?

(1) ටී.බී ටයිලර් (3) ජොහාන් කෙප්ලර්

(2) ජොහාන් ගැල්ටුන් (4) මහාචාර්ය ගානර්

02. ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියේ සංකල්ප පිළිවෙළින් විස්තර වන පිළිතුර වන්නේ,

(1) සන්දර්භය,චර්යාව හා ආකල්ප (3) චර්යාව, සන්දර්භය හා ආකල්ප

(2) ආකල්ප,චර්යාව හා සන්දර්භය (4) චර්යාව ,ආකල්ප හා සන්දර්භය

03. ගැටුම් නිරාකරණය සඳහා පුරවැසියකු සතුවිය යුතු සමාජීය ගුණාංගයක් වනුයේ,

(1) සංවේදී බව (3) යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා

(2) අවිහිංසක බව (4) ඉවසීම

04. සාර්ව ගැටුම් සඳහා උදාහරණයක් වන්නේ,

(1) පුද්ගලයන් අතර ඇතිවන ගැටුම් (3) පවුල් අතර ඇතිවන ගැටුම්

(2) පවුල් තුළ ඇතිවන ගැටුම් (4) ජන වර්ග අතර ඇතිවන ගැටුම්

05. ගැටුම් විසඳීමේ මැදිහත්කරුවකු තුළ **නොතිබිය** යුතු ගුණාංගයක් වන්නේ,

(1)පක්ෂපාතීත්වය (3) මධ්‍යස්ථ බව

(2) විශ්වාස බව (4) අවංක බව

❖ **ප්‍රශ්න අංක 6 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න**

6. මනසේ සාමය ඇති කර ගැනීම සඳහා යොමු විය හැකි අංශ දෙකක් දක්වන්න.

   I. .....

   II. .....

7. ජොහාන් ගැල්ටුන් විසින් ඉදිරිපත් කරන ලද ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය අඳින්න.

8. ගැටුම් ඇතිවන පාර්ශව දෙකක් නම් කරන්න.

   I. .....

   II. .....

9. ගැටුම් වර්ග ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් යටතේ දක්වන්න.

   I. .....

   II. .....

10. අභ්‍යන්තර ගැටුම් යන්න කෙටියෙන් හඳුන්වන්න.

   .....

   .....

   .....

   .....

11. අන්තර්ජාතික ගැටුම් යන්න හඳුන්වන්න.

   .....

   .....

12. ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන **ප්‍රධාන මූල** තුනක් ලියන්න.

I. .....

II. .....

III. .....

13. ගැටුම් නිරාකරණය සඳහා යොදා ගතහැකි ක්‍රම තුනක් නම් කරන්න.

....

.....

14. මැදිහත්කරුවෙකු තුළ පැවතිය යුතු ගුනාංග තුනක් ලියන්න.

.....

.....

.....

15. ගැටුම් නිරාකරණය සඳහා පුරවැසියෙකු සතුවිය යුතු,

I. පුද්ගල ගුණාංග තුනක් නම් කරන්න

.....

.....

.....

II. සමාජීය ගුණාංග තුනක් නම් කරන්න

.....

.....

.....

සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

විෂයය	ශ්‍රේණිය	වාරය	පාඩම
පුරවැසි අධ්‍යාපනය	10	03	05. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය -පිළිතුරු-

සැකසුම - පී.ඒ. නන්දන ජයකුමාර, බප/හො/මීවනපලාන මහා විද්‍යාලය

(1) - 2

(2) - 3

(3) - 3

(4) - 4

(5) - 1

6. පහත කරුණු වලින් දෙකක්;

ආගමික වතාවත් කෙරෙහි යොමු වීම

මනෝ විද්‍යාත්මක අභ්‍යාස මගින්

උපදේශනය මගින්

ස්වාභාවික පරිසරය නිරීක්ෂණය මගින්

7.



8. පහත කරුණු වලින් දෙකක්;

පුද්ගලයා තුළ

පුද්ගලයින් අතර

ජන කණ්ඩායම් අතර

රටවල් අතර

9. 1 අභ්‍යන්තර ගැටුම්

2. අන්තර්ජාතික ගැටුම්

10. යම් රටක ජීවත්වන ජනතාව තුළ දැකිය හැකි පුද්ගල ගැටුම් හා සමාජීය ගැටුම් අභ්‍යන්තර ගැටුම් ලෙස හඳුන්වයි

11. රටවල් අතර පවත්නා ගැටුම් අන්තර්ජාතික ගැටුම් ලෙස හඳුන්වයි

12. පහත කරුණු වලින් තුනක්;

වාර්ගිකත්වය

දේශපාලන මතවාද

ආගමික මතවාද

සමාජ ආර්ථික ගැටලු

13. පහත කරුණු වලින් තුනක්;

සාකච්ඡා ක්‍රමය

කේවල් කිරීම හා සහමන්ත්‍රණය

මැදිහත්කරණය

සමථකරණය

බේරුම් කිරීම

විනිසීම

උපදේශනය

14. පහත කරුණු වලින් තුනක්;

හොඳ සවන් දෙන්නකු වීම

විශ්වාසවන්තභාවය

කැපවීම

අවංකවීම

අපක්ෂපාතීත්වය

මධ්‍යස්ථභාවය

විචාරශීලී හා නිර්මාණශීලීබව

15. 1. පහත පුද්ගල ගුණාංග වලින් තුනක්;

ඉවසීම

මුදිතාව

කරුණාව හා මෛත්‍රිය

අවිහිංසකබව

සංවේදීබව

ඵලදායී සන්නිවේදනය

දරා ගැනීමේ ශක්තිය

ඵලදායි තීරණ ගැනීම

නිර්මාණාත්මක චින්තනය

ආත්මාවබෝධය

2. පහත සාමාජයීය ගුණාංග වලින් තුනක්;

අන්මත ගරු කිරීම

යහපත් අන්තර් පුද්ගල සබඳතා

යුතුකම් ඉටුකිරීම

සාධාරණත්වය

ජය පරාජය විඳ දරා ගැනීම

අන් අයට ගරු කිරීම

පරිත්‍යාගශීලී වීම

සවන් දීම

සහානුභූතිය